## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2010

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1. ගණකාධිකරණ අඩුපාඩු

උසස් තාක්ෂණ ආයතනයේ නයිවල හා කුරුණෑගල මධ්‍යස්ථාන පිහිටා ඇති ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. එසේම ඉතිරි මධ්‍යස්ථාන 08 පිහිටි ඉඩම් හා ගොඩනැගිලි ආයතනය වෙත නීත්‍යානුකූලව පවරාගෙන ඒවායේ වටිනාකම් එසේ ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

1.2.2. ලැබියයුතු/ගෙවියයුතු ගිණුම්

(අ) නිරවුල් නොකළ ණය ශේෂ

ඉදිකිරීම් සේවා සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවියයුතු රු 7,872,590 ක් වටිනා වසර 5ට වඩා පැරණි ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 15,686,531 ක් වටිනා වත්කම් හා බැරකම් සනාථ කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොවීය.

1.2.3. නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

2008 අගෝස්තු 15 දිනැති අංක 51 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවීම වෙනුවෙන් 2010 වර්ෂය සඳහා රු.7000 ක මුදලක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1. මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හා විදේශ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.396,653,727 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී ඌනතාවය රු.282,572,159 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.304,317,000 ක රජයේ ප්‍රදාන හා විදේශාධාර ලැබීම් රු.4,526,813 ගණන් ගැනීමෙන් පසු ඌනතාවය රු.87,809,913 ක් වූ අතර ඉකුත් වර්ෂයේ රු.215,600,000 ක් වූ රජයේ ප්‍රදාන හා විදේශ ආධාර ලැබීම් රු1,148,353 ගණන් ගැනීමෙන් පසු ඌනතාවය රු.65,823,806 ක් වී තිබුණි.

### 2.2. මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශිෂ්‍ය ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රගතය

| පාඨමාලාව | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව | 1955 | 1420 | 1389 | 1402 | 1502 |
| උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව | 382 | 232 | 333 | 451 | 419 |
| උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව | 236 | 200 | 206 | 221 | 245 |
| උසස් ජාතික තාක්ෂණ (කෘෂි) ඩිප්ලෝමාව | 163 | 69 | 92 | 142 | 139 |
| උසස් ජාතික ඉංග්‍රීස ඩිප්ලෝමාව | 584 | 570 | 757 | 989 | 989 |
| උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමාව | 150 | 97 | 155 | 142 | 180 |
| උසස් ජාතික ව්‍යාපාර මූල්‍යකරණ ඩිප්ලෝමාව | 36 | 32 | 30 | 48 | 64 |
| උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව | 103 | 271 | 304 | 367 | 385 |
| එකතුව | 3609 | 2891 | 3266 | 3762 | 3923 |
| පූර්ව වර්ෂයට සාපේක්ෂව වෙනස්වීමේ ප්‍රතිශතය | - | (22%) | 13% | 15% | 4% |

- 2009 වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය ලියාපදිංචියේ ප්‍රගතිය 2010 වර්ෂයේ දී 4% ක් විය.

(ආ) 2010 වර්ෂයේ දෙවන සමාසයේ විභාගය සඳහා පළමු වරට ඉදිරිපත් වූ සියලුම සිසුන්ගේ සමස්ථ ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| උසස් ජාතික පාඨමාලාවන් | අයදුම්කරුවන් සංඛ්‍යාව | විභාගය සඳහා පෙනීසිටි සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව | අසමත් වූ සංඛ්‍යාව | විභාගය සඳහා පෙනී නොසිටි සංඛ්‍යාව | ශිෂ්‍යභාවය අත්හිටුවීම් | විභාගය සඳහා පෙනී සිට සමත්වූ සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| ගණකාධිකරණ | 3375 | 3227 | 1581 | 1646 | 148 | 16 | 49% |
| කළමනාකරණ | 747 | 712 | 313 | 399 | 35 | 06 | 44% |
| ඉංග්‍රීසි | 999 | 969 | 761 | 208 | 30 | 01 | 79% |
| තාක්ෂණ (කෘෂි) | 174 | 162 | 64 | 98 | 12 | 01 | 40% |
| ව්‍යාපාර අධ්‍යයන | 234 | 219 | 72 | 147 | 15 | 03 | 33% |
| ව්‍යාපාර මූල්‍යකරණ | 79 | 78 | 43 | 35 | 01 | 03 | 55% |
| තොරතුරු තාක්ෂණ | 498 | 460 | 186 | 274 | 38 | 02 | 40% |
| **එකතුව** | **6106** | **5827** | **3020** | **2807** | **279** | **32** | **52%** |

- පවත්නා පාඨමාලා 07 න් පාඨමාලාවන් 04 ක් සඳහා සමත්වූවන්ගේ සංඛ්‍යාව විභාගයට පෙනීසිටි සංඛ්‍යාවෙන් 50% කට වඩා අඩු සංඛ්‍යාවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.2.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ආරක්ෂක සේවා සැපයීම</u>

ආරක්ෂක සේවාව ලබා ගැනීමේ ටෙන්ඩර් කොන්දේසි අංක 24 අනුව සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීවරයෙකු හෝ නියාමකවරයෙකු නොකඩවා පැය 24 ට වඩා සේවයේ නොයෙදිය යුතු වුවත්, කුරුණෑගල තාක්ෂණ ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකු පැය 36 බැගින් සේවයේ යෙදී සිටි බව ඒ පිළිබඳ නඩත්තු කරණු ලබන ලේඛණයෙන් තහවුරු වුවද එවැනි අවස්ථා වල ගිවිසුමට අනුව 10% අධිභාරයක් අයකර ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) <u>ව්‍යතිරේඛ විෂයයන්</u>

I. සමාලෝචිත වර්ෂයේ කළුවැල්ල උසස් තාක්ෂණ ආයතනය ඉවත් කර ගැනම හේතුවෙන් එහි ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා දරන ලද රු. 15,942,448 ක මුදල (ක්ෂය අඩු කල පසු වටිනාකම) ආදායම් වියදම් ගිණුමින් ලියා හැර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ඉඩකඩම් පවරා ගැනිම

(ඈ) පුස්තකාල පරිපාලනය